විධාන අංක 20.

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

12 (1) වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 12 (1) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් පහත සඳහන් කරනු ලබන වානේ වර්ග අනුරූප ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර වලට අනුකූල වන්නේ නම් මිස සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරනු ලබන SLS භාණ්ඩ සහතික ලාංඡනය දරන්නේ නම් මිස කිසි ම නිෂ්පාදකයෙකු, ආනයනකරුවෙකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් එකී වානේ වර්ග නිපදවීම, ආනයනය කිරීම, බෙදා හැරීම, ගබඩා කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

(1) කොන්ක්‍රීට් වැර ගැන්වීම පිණිස යොදන නාරටි වානේ දඬු සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර - SLS 375

(2) කොන්ක්‍රීට් වැර ගැන්වීම පිණිස යොදන සරල වානේ දඬු සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර - SLS 26

මෙම විධානය වර්ෂ 2008 මාර්තු මස 01 වන දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්ෂුක්,
සභාපති.

2008 ජනවාරි මස 25 වැනි දින,
කොළඹ දී ය.

02 - 284/2

---

විධාන අංක 21.

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

12 (1) වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 12 (1) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් පහත සඳහන් කරනු ලබන දේශීය ව නිෂ්පාදනය කරනු ලබන වානේ වර්ග කිසි ම නිෂ්පාදකයෙකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරනු ලබන SLS භාණ්ඩ සහතික ලාංඡනය දරන්නේ නම් මිස එකී වානේ වර්ග නිෂ්පාදනය කිරීම, බෙදා හැරීම, ගබඩා කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට සහ පහත සඳහන් කරනු ලබන ආනයනික වානේ වර්ග ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් 1987 අංක 28 හා 1985 අංක 48 දරන පනත් වලින් සංශෝධිත 1969 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 20 වගන්තිය යටතේ ප්‍රකාශිත 2006 ආනයන (ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලනය ) රෙගුලාසි යටතේ ක්‍රියාත්මක කරනු ලබන ආනයන පරීක්ෂණ ක්‍රමය යටතේ පරීක්ෂා කර විකිණීම සඳහා අනුමත කර ඇත්නම් මිස කිසිම ආනයනකරුවෙකු, බෙදා හරින්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් එකී වානේ වර්ග ආනයනය කිරීම, බෙදා හැරීම,ගබඩා කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

(1) ව්‍යුහාත්මක සහ සාමාන්‍ය ඉංජිනේරු කටයුතු සඳහා භාවිතා වන තාපනීය ලෙස රෝල් කරන ලද වානේ දඬු - SLS 949

(2) සාමාන්‍ය ඉංජිනේරු කටයුතු සඳහා භාවිතා වන මෘදු වානේ කම්බි - SLS 139

(3) කම්බි ඇණ නිෂ්පාදනය සඳහා භාවිතා වන ඇල් තත්ත්ව යටතේ අඳින ලද වානේ කම්බි - SLS 7

(4) තාපනීය ලෙස රෝල් කරන ලද ව්‍යුහාත්මක වානේ ඡේදවල මාන සහ ඡේදීය ගුණාංග - SLS 907

මෙම විධානය වර්ෂ 2008 මාර්තු මස 01 වන දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්ෂුක්,
සභාපති.

2008 ජනවාරි මස 25 වැනි දින,
කොළඹ දී ය.

02 - 284/3

---

විධාන අංක 22.

## 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

12 (1) වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 12 (1) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් පහත සඳහන් කරනු ලබන දේශීය ව නිෂ්පාදනය කරන පී.වී. සී. පයිප්ප සහ උපාංග කිසි ම නිෂ්පාදකයෙකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරනු ලබන SLS භාණ්ඩ සහතික ලාංඡනය දරන්නේ නම් මිස එකී පයිප්ප සහ උපාංග නිෂ්පාදනය කිරීම, බෙදා හැරීම, ගබඩා කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට සහ පහත සඳහන් කරනු ලබන ආනයනික පී.වී. සී. පයිප්ප සහ උපාංග වර්ග ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් 1987 අංක 28 හා 1985 අංක 48 දරන පනත් වලින් සංශෝධිත 1969 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 20 වගන්තිය යටතේ ප්‍රකාශිත 2006 ආනයන (ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලන ) රෙගුලාසි යටතේ ක්‍රියාත්මක කරනු ලබන ආනයන පරීක්ෂණ ක්‍රමය යටතේ පරීක්ෂා කර විකිණීම සඳහා අනුමත කර ඇත්නම් මිස කිසි ම නිෂ්පාදකයෙකු, බෙදාහරින්නෙකු, ආනයනකරුවෙකු හෝ වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් එකී පයිප්ප සහ උපාංග ආනයනය කිරීම, බෙදා හැරීම, ගබඩා කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

(i) පානීය සිසිල් ජල සැපයුම් සඳහා වූ සුවිකාර්යය නොවන පොලිවයිනයිල් ක්ලෝරයිඩ් නල - SLS 147

(ii) පානීය සිසිල් ජල සැපයුම් සඳහා වූ සුවිකාර්යය නොවන පොලිවයිනයිල් ක්ලෝරයිඩ් නල සන්ධීන් සහ උපාංග- SLS 659

මෙම විධානය වර්ෂ 2008 මාර්තු මස 01 වන දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්ෂුක්,
සභාපති.

2008 ජනවාරි මස 25 වැනි දින,
කොළඹ දී ය.

02 - 284/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.